පත්තරයකට වඩා වැඩි යමක්

සංස්කාරක - Editor
චන්ද්‍රරත්න බණ්ඩාර
Chandrarathna Bandara

වෙබ් අඩවි සංස්කාරක: **රුචින්ද්‍ර අබේතුංග**

රූ රටා සංස්කරණය: **සමන්ත ගමගේ**

ඡායාරූප සංස්කාරක: **නිමල් එගොඩ ගෙදර**

පරිඝනක අක්ෂර සංයෝජනය: **චන්දිමා පීරිස්**

දුරකථනය: **416-994-2393**
Email: **yathranews@gmail.com**
Web: **www.yathranews.com**

Address:
50-2080A, LAWRENCE AVE (EAST)
TORONTO, ONTARIO, M1R2Z5

වැඩවසම්, යටිකූට්ටු හා ඩීල් දේශපාලනයක් වෙනුවට.....

ගෙවී ගිය අරගලයෙන් නිරූපිත මහජන හැඟීමේ ප්‍රතිඵලය හරියට නිකුත් වන්නේ එළැඹෙන සැප්තැම්බර් 21 වනදාය. 1947 සිටම ජාතිය, ආගම, තොරොම්බල් කරමින් පාලනය වූ රටක ආර්ථිකය හා යහපාලනය යන දේශපාලන මූලධර්මවලට අනුකූලව මහජන තීන්දුව පළමුවරට නිරූපණය කරනු ඇත්තේ එදාටය. 1947 නිදහස ගන්නට හදාගත් පක්ෂයේ ලාංඡනය, 'අලියා' ලකුණ එක්සත් ජාතික පක්ෂයේ මූලස්ථානයෙන් ගැලවී එතැනට 'ගෑස් සිලින්ඩරයට' සිනාසෙන ජාතියේ පියා ඩී.ඇස්. සේනානායකය. සංසාරික පැවැත්මක් ඇත්නම් ඔහු එදෙස බලා සිටිනු ඇත්තේ කවර තරම් සංතාපයකින් විය හැකිද?

1970 මහ මැතිවරණයේ දී ජය ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ 'සමගි පෙරමුණ' සංධානයය. එය ජය ගනු ලැබුවේ තිබුණු ආසන ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් ලබමිනි. එසේ වූයේ පැවති කේවල මැතිවරණ කොට්ඨාස ක්‍රමයට අනුවය. එහෙත් ජේ.ආර්. ජයවර්ධනගේ ගණන් බැලීම අනුව සමස්ත ඡන්ද ප්‍රමාණයෙන් වැඩි පංගුවක් වැටී තිබුණේ එක්සත් ජාතික පක්ෂයටය.

කොහොමටත් පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ලංකාවට 'පමණට වැඩියයි' සිතූ ජේ.ආර් යට කී කරුණ ද සිත්හි තබාගෙන තමන්ගේ ඡන්ද පදනමට වැඩි වාසි සැලසෙන අනුපාත ඡන්ද ක්‍රමය රටට හඳුන්වා දුන්නේය. ජේ.ආර්. මේ හඳුන්වාදීම තුළින් බලාපොරොත්තු වූයේ හැමදාමත් එක්සත් ජාතික පක්ෂයට බලයට පත්ව සිටීමට හැකිවේය කියාය. එම බලාපොරොත්තුවට සරිලන ලෙස ව්‍යවස්ථාවක්ද ගෙන ආවේය. එය තවත් ශක්තිමත් මදි යයි සිතූ ඔහු සංශෝධන ගණනාවක්ද ව්‍යවස්ථාවට පසුකාලීනව ඇතුලු කළේය. ඩී.ඇස්ට, බණ්ඩාරනායකලාට, තිබුණාසේම ජේ.ආර්ට ද තම ලේ ඥාතීත්වයක් සහිත කෙනෙකු පක්ෂ නායකත්වයටත්, රටේ නායකත්වයටත් පත් කිරීමට අභිප්‍රායක් තිබුණේය. ඔහුගේ අසම්මත ගති සිරිත් හා ලෝක දැක්මක් තිබුණු පුත්‍රයාට දේශපාලනය රුචි නොවීය. ඔහු පියාගේ ආරයට නොව මවගේ ආරයට ජීවත් වෙන්නට උත්සාහ කළ හෘද සාක්ෂියක් සහිත මිනිසෙකැයි සිතිය හැකිය. ඒ නිසාම ජේ. ආර්ගේ අනාගත පැතුම වූයේ රනිල් වික්‍රමසිංහය. ඒ ඔහුට සිටි දේශපාලන උනන්දුවක් තිබූ සමීප ඥාතියා පමණක් නොව ඔහුගේ සෑම දේශපාලන සැලසුමකම පිටුපසින් සිටි සමීප සගයා වූ එස්මන්ඩ් වික්‍රමසිංහගේ පුත්‍රයාය.

1977 එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණයත් සමගම විසි අට හැවිරිදි ලාබාලයකු වූ රනිල් වික්‍රමසිංහට වගකීම් පැවරුවේ අනාගත නායකත්වයට පුහුණු කිරීමේ අටියෙනි. එහෙත් ඒ තෝරාගත් පුද්ගලයා සාමාන්‍ය මිනිසකු නොවීය. කවර තරම් මහජනයා ඔහු වටා රැස් කෑවත්, සිය මාමා වූ ජේ.ආර්. මෙන්ම මහජනයා විශ්වාස නොකළේය. ඔහු විශ්වාස කළේ ඩීල් සහ යටිකූට්ටු වැඩ මගින් මෙම නූගත් මිනිස්සුන්ගේ අනුකූලතාවය ලබාගත හැකිවේය කියාය. ඒ අදහස ජේ.ආර්ගේ මුල් කාල පරිච්ඡේද දෙකට ගැලපුණේය. එහෙත් ප්‍රේමදාස නම් චරිතය ගොඩ නැඟුණේ ජේ. ආර්ගේ සොම්බි දැක්මට ව්‍යතිරේකයක් වශයෙනි. සමාජයේ සෑම අතින්ම අව වරප්‍රසාදිත මිනිසකු ලෙස උපත ලබා මහජන දේශපාලනය තුළින් රටේ ඉහළම තැනට ආවේ එක්සත් ජාතික පක්ෂයේ එතෙක් තිබුණු පංති පදනමද පුපුරවා හරිමිනි.

ජේ.ආර්ගේම ගති ලක්ෂණ ඔහුටත් වඩා තිබෙන සිය ඥාතිපුත්‍රයා බලයට පැමිණීමේ මාර්ගය විවර වන්නේ රනිල්ට වඩා සුදුසුකම් සහිත ගාමිණී දිසානායක හා ලලිත් ඇතුලත්මුදලිගේ පමණක් නොව ප්‍රේමදාසගේද මරණය ඔස්සේය. සැබැවින්ම එය තර්කානුකූල නායකත්වනයට පත්වීමක් නොව ලේ වැකුණු මාවතක් ඔස්සේ පැමිණි ගමනකි. කෙසේ වෙතත් 'රනිල්ට' හොඳින් සෙල්ලම් කළ හැකි ලෙස පක්ෂ ව්‍යවස්ථාවක්ද, රටේ ව්‍යවස්ථාවද සැකසී තිබිණි. එක්සත් ජාතික පක්ෂයට සදාකල් බලයේ සිටීමට සැකසී තිබුණු මැතිවරණ ක්‍රමයත්, ඒකාධිපති පක්ෂ ව්‍යවස්ථාව හෝ රටේ ව්‍යවස්ථාවත් තමන්ට වාසිදායක ලෙස යොදා ගැනීමට ජේ.ආර්.ගේ අනුප්‍රාප්තිකයාට නොහැකි බවට හොඳම හා කදිම උදාහරණය වන්නේ එක්සත් ජාතික පක්ෂය පසුගිය මහා මැතිවරණයෙන් බිංදුවට වැටීමය. අද වන විට සිය පක්ෂ ලකුණ යොදාගෙන ජයග්‍රහණයක බලාපොරොත්තු තබාගත නොහැකි තත්වයක් උදාවී ඇත.

රනිල් කවදාවත් ජනයාට බලයක් ඇතැයි ඔවුන්ට ශක්තියක් ඇතැයි විශ්වාස නොකළ වැඩවසම් නායකයෙකි. ඉතිහාස රංගනය දෙවරක්ම වේදිකාව මත දිග හැරෙමින් තිබේ. ජේ.ආර්. මතවාදය පක්ෂ තුළ පරදා ප්‍රේමදාස දිනුවේය. අද සිදුව ඇත්තේ මතවාදී වශයෙනුත් මහජන බලය පැත්තෙනුත් ජේ.ආර්ගේ බෑණා ප්‍රේමදාසගේ පුතා අතින් පරාජයට පත්වීමය.

අද 2024 දී, ඩී.ඇස්ගෙන් පටන් ගත් ඥාති සංග්‍රහ දේශපාලනය නිමා වෙන්නට සූදානමකින් සිටී. එය බෙහෙවින් අසීරු කාර්යයකි. බ්‍රිතාන්‍යයන්ගෙන් ලැබුණු ප්‍රජාතන්ත්‍රවාදය වැඩවසම් ඒකාධිකාරයක් කිරීමට ඩී.ඇස්ගේ සිට රනිල් වික්‍රමසිංහ දක්වා සියලු පාලකයන් කටයුතු කළේය. අද ජනාධිපතිවරණයට ජනාධිපතිවරු දෙදෙනකුගේ පුතුන් දෙදෙනාත්, අනෙක් පසින් ජනාධිපතිවරයාගේ ප්‍රියතම ඥාති පුත්‍රයාත් තරග වදින්නේ ඒ වැඩවසම් ඥාති සංග්‍රහයට පාර කැපී තිබීම හේතුවෙනි. ඒ වැඩවසම් ගොනුවට එරෙහිව තරග වදින්නේ ද - බොහෝ විට ජයග්‍රහණය - කරනු ඇත්තේ ද මහජන බලය හා මිනිසුන්ගේ පීඩාව නියෝජනය කරන මහජන නියෝජිතයෙකි.

අනෙක් අපේක්ෂකයන් තිදෙනාම රෝයල් හා තෝමියන් වන විට ඒ තැනැත්තා තඹුත්තේගම මහා විද්‍යාලයෙනි. අනෙක් තිදෙනාටම අත්වැලක් වී වේදිකාවට ගොඩ කළේ සිය පියවරුන් හා සමීප ඥාතීන්ය. එහෙත් මොහුට කිසිවකු අත්වැලක් වූයේ නැත. ක්‍රියාකාරිත්වය, කැපවීම හරහා ව්‍යාපාරයක අවංකව නිරතවීම නිසා ඉහළට ආ අයෙකි.

මේ අප ගෙවා දමන්නේ ඓතිහාසික කාල වකවානුවකි. තීරණාත්මක මොහොතකි. අද රටේ පවත්නා ආර්ථික සමාජ, දේශපාලන හා සංස්කෘතික ගිනිහුල නිවාදැමීමට පරම්පරා දේශපාලනයට නොහැකිය. පැරණි හෝ නවීන වැඩවසම්වාදයකට නොහැකිය. එය සාමූහික ශක්තිය හා දැනුම ගැන පමණක් විශ්වාසය තබන නායකත්වයකට පමණක් කළ හැක්කකි. ඒ සඳහා යථාර්තයන්ට ගැළපෙන විද්‍යාත්මක චින්තනයක් කෙරේ විශ්වාසය තැබිය යුතුය.

ජනයා පොතපතින් මෙන්ම සිදුවීම් හා අත්දැකීම්වලින්ද ඉගෙන ගනිති. අරගලය යනු ජනයා උසස් අධ්‍යාපනයක් ලැබූ මෑතකාලීන දේශපාලන විශ්ව විද්‍යාලයයි. එලෙස ඉගෙන ගත් ජනයා තීන්දු ගන්නේ පෙර පරිදි නොවේ. ලංකාවේ බලය යනු එය දරන්නාට කවර තරම් සිරි සෙත දෙන්නක් ද බව මේ ජනාධිපතිවරණ සමයේ කඳවුරෙන් කඳවුරට පනින රිලා නැටුම්වලින් පෙනේ. බලයේ රාවය යහපත් බවේ සියලු සීමා පරයා යයි.

ඒ සඳහා හොඳම උදාහරණය පාඨලී චම්පික රණවකය. ඔහුගේ දැනුම හා හැකියාව ගැන මේ ලියන ලේඛකයාට නම් කිසිදු ගැටලුවක් නැත. එහෙත් ඔහුගේ හෘදසාක්ෂිය ගැන අපට තිබුණු සැකය දැන් යථාර්ථයක් බවට පත් කොට තිබේ. සමගි ජන බලවේගයෙන් ඔහු ඉවත්ව ආවේ නූතනත්වයට නොගැළපෙන නායකයෙක් යැයි සජිත්ට පස් පඩංගුවේ බැණ වදිමිනි. පැනුමට පෙර සන්නස්ගලගේ නාලිකාවෙන් සජිත්ව විවේචනය කළේ මහන්සි වී වැඩ කළ හැකි, එහෙත් අරමුණක් නැති නායකයෙකු යැයි පවසමිනි. එහෙත් බලය හා ඉනික්බිති ලැබෙන යස ඉසුරු ඔහුට ඔහුගේම දැනුම, පයින් පාගන්නට සලස්වා තිබේ.

මේ දේශපාලනයේ ස්වරූපය ජනයා මැනවින් තේරුම් ගනිමින් තිබේ. ජනාධිපතිවරණයට පෙරම ජන පෙළගැස්ම සකස් වී ඇත්තේ ශිෂ්ටත්වය හා අශිෂ්ටත්වය වශයෙනි. තමන්ගේ ප්‍රබල සහෝදරයාත් සජබ හෝ එජාප වේදිකාගත වෙද්දී ඇතැම් කීර්තිමත් උදවිය මාළිමාවට සහය පළ කරන්නේ හෘද සාක්ෂිය වැඩ කරන්නේ එලෙස වන හෙයිනි.

වසර හතළිහක් පමණ දේශපාලනය කළ අප මේ මොහොත අතහැර දමුවහොත් එමගින් ඓතිහාසික වරදක් කරන්නමෝ වන්නෙමු. එමෙන්ම නිසි අවස්ථාවේ නිසි තැන හිටගන්නට බැරිවීමේ වරදේ පීඩාවෙන් මිදීමට අපි අපොහොසත් වන්නෙමු. එළඹෙන අපගේ නියත මහලු විය මැරෙනතුරු සංතාපයෙන් ගත කරන්නට අපට සිදුවනු ඇත.

සංස්කාරක



යාත්‍රා අන්තර්ගතය.

යාත්‍රා පුවත්පතේ පළකරන ආගමික විශ්වාසයන් හා එවැනි පාරභෞතික කාරණා ඇතුළත් ලිපි, වෙළෙඳ දැන්වීම් ආදියෙහි අන්තර්ගතයන් පුවත්පතේ අදහස් නියෝජනය නොකරයි. එමෙන්ම ඒ ඒ ලිපිවල දේශපාලන ආස්තානයන්ද පුවත්පතේ අදහස් නොව එවා ලියන ලේඛකයන්ගේ හා ආයතනවල අදහස් බව සැලකව මනාය. අප මේ විවිධත්වයට ඉඩ සලසා දෙන්නේ සෑම අදහසක්ම දැන ගැනීමේ පාඨක අයිතියත්, ඒවා සමාජය හමුවේ පැවතීමේ අයිතියත් අප පිළිගන්නා හෙයිනි.

සංස්කාරක



Sisara with chandare
යූ ටියුබ් නාලිකාවට පිවිස
අගනා වාර්තා වැඩසටහන් නරඹන්න.